විගණකාධිපති (වැ.බ.)

විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂගේ නිරීක්ෂණ

ජාතික යොවුන් සේනාංකය
தேசிய இளைஞர் படையணி
NATIONAL YOUTH CORPS

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය இளைஞர் அலுவல்கள் மற்றும் விளையாட்டு அமைச்சு MINISTRY OF YOUTH AFFAIRS AND SPORTS

මගේ අංකය/எனது இல/My No : YC/5/10/Audit 2024

ඔබේ අංකය/உமது இல/Your No : SYA/E/NYC/2024/01

දිනය/திகதி/Date : 2025/07/03

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
අංක 306/72,
පොල්දූව පාර
බත්තරමුල්ල

ජාතික යොවුන් සේනාංකයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගනකාධිපති වාර්තාව

ජාතික යොවුන් සේනාංකය සම්බන්ධයෙන් ඔබ විසින් ඉදිරිපත් කර ඇති කෙටුම්පත් වාර්තාව සඳහා අදාල සවිස්තරාත්මක තොරතුරු මේ සමඟ ඉදිරිපත් කරමි.

බී.ඒ. ගාමිණී වික්‍රමපාල
අධ්‍යක්ෂ

අංක 420, බෞද්ධාලෝක මාවත, කොළඹ - 07 இல 420, பௌத்தாலோக்க மாவத்தை, கொழும்பு - 07. No 420, Bauddhaloka mawatha, Colombo - 07.

0112-688 885 / 0112-669 237 FAX 0112-684 784 info@youthcorps.lk www.youthcorps.lk

අධ්‍යක්ෂ
පණිප්පාණර්
Director
Tel: 0112-690 293

අතිරේක අධ්‍යක්ෂ (පාලන හා මූල්‍ය)
மேலதிக பணிப்பாளர் (நிருவாகமும் நிதியும்)
Additional Director (Administration and Finance)
Tel: 0112-676 007

අතිරේක අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන)
மேலதிக பணிப்பாளர் (பயிற்சியும் அபிவிருத்தியும்)
Additional Director (Training and Development)
Tel: 0112-267 0371

ජාතික යොවුන් සේනාංකයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගනකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

1.2 මහත සඳහා පදනම

1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර) අනුකූල නොවීම

(අ) ජාතික යොවුන් සේනාංකය පවත්වාගෙන යනු ලබන ඉඩම් අතුරින් ඉඩම් 29 ක් පමණක් මේ වන විට පවරා ගැනීම් සිදු කර ඇත. එහෙත් එම පවරා දීම් සිදු කර ඇත්තේ ජාතික යොවුන් සේනාංකය අයත් රේඛීය අමාත්‍යාංශය වෙත බැවින්, එම පවරා ගත් ඉඩම්හි වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනයන් තුල ඇතුලත් කර නොමැති බව පිළිගනිමි. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල දේපල පිරියත හා උපකරණ (Note 05) යටතේ ද ඉඩම් වටිනාකම් ඇතුලත් කර නොමැති අතර, අදාල ගෙඩනැගිලි වටිනාකම් පමණක් ඇතුලත් කර ඇත.

(ආ) පෙර වර්ෂයේ විමසුම් වාර්තාව මඟින් පෙන්වා දුන් වැරදි නිවැරදි කිරීම ජර්නල් සටහන් මඟින් 2024 වර්ෂයේදී නිවැරදි කිරීම් සිදු කරන ලදී. එලෙස නිවැරදි කිරීම් සිදු කිරීමේදී මූල්‍ය ප්‍රකාශන වල ආරම්භක ශේෂයන්හි සංශෝධනාත්මක වෙනසක් ඇති වී ඇත. විමසුම මඟින් පෙන්වා දී ඇති පරිදි සංශෝධනයන් ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙන්ස්වීම් සහ වැරදි හි 47, 48 හා 54 ඡේද වල විධිවිධාන ප්‍රකාරව ඉදිරි වර්ෂයේදී හෙළිදරව් කිරීමට කටයුතු කරමි.

1.2.2 ගණකාධිකරණ අඩුපාඩු

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පාරිතෝෂික වෙන් කිරීම් වටිනාකම් තුල 2024 දක්වා වන පාරිතෝෂික වටිනාකම් ඇතුලත් වේ. කාරක ප්‍රාග්ධන විචලනය තුලින් 2024 වර්ෂය සඳහා ගෙවිය යුතු පාරිතෝෂික මුදල වන රු 2,140,115.00 ක මුදල ඉවත් කිරීමෙන් රු 341,222.00 ක් ලබා ගෙන ඇත්තේ එතුලින් සිදු වන ද්වි ගණනය වැලැක්වීම සඳහාය. ඒ අනුව රු 2,140,115.00 ක වටිනාකම දිගු කාලීන වගකීමකින් අඩු කර කෙටි කාලීන වගකීමක් ලෙස හඳුනා ගනිමින් 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය තුල දක්වා ඇත.

1.2.3 නොසැසඳුණු අඩුපාඩු

ගෙවිය යුතු පාරිතෝෂික ගිණුම රු.3,463,865 ක් වැඩියෙන් දැක්වීමට හේතුව එහි ආරම්භක ශේෂය තුළ පවතින වෙනස්කම් බව හඳුනාගන්නා ලද අතර, එය නිවැරදි කිරීමට ජරනල් සටහන යොදා ඇත. ඒ අනුව 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල එම නිවැරදි කිරීම් සිදු කර පෙන්වීමට කටයුතු කරමි.

1.2.4 ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකිරීම

දීර්ඝ කාලීනව අය නොවී පවතින රු. 99,863,619 ක අත්තිකාරම් පිළිබඳ තොරතුරු විමසුමෙහි 2.3 හි (අ) යටතේ දක්වා ඇති බැවින්, ඊට සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් ලබා දී ඇත. ඊට ඇතුලත් දැනුවත් කිරීම් හා තොරතුරු ලිපි අදාල විෂය ගොනු තුල ඇති බව දන්වා සිටිමි.

1.3 සේනාංකයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

2. වෙනත් නෛතික හා නියමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.2.2 නීතිරීති හා විධි විධාන වලට යොමුව	නිරීක්ෂණ
(අ)	
(i) 08 වගන්තිය	ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යාංශය හරහා ලබා දෙන අකෘතිපත්‍රයට අනුව ජාතික යොවුන් සේනාංකය විසින් මේ දක්වා අය වැය ලේඛණය සකස් කර ඇත. එම අකෘතිපත්‍රය තුල අරමුදල් ලැබෙන මාර්ගයන් පිළිබඳ පුරෝකථනය කිරීම සඳහා වූ තොරතුරු සටහන් කිරීමේ ක්‍රමවේදයක් නොමැති වූ හෙයින් මේ දක්වා ජාතික යොවුන් සේනාංකය එම පුරෝකථනය අනුගමනය කර නොමැති බව පිළිගනිමි. විමසුම මඟින් පෙන්වා දී ඇති කරුණු පදනම් කරමින්, ඉදිරි වර්ෂය සඳහා සකස් කරනු ලබන අයවැය ලේඛණයේදී අයවැය දෙපාර්තමේන්තුව වෙතින් යොමු කරනු ලබන අකෘතියට අනුව අරමුදල් ලැබෙන මාර්ගයන් ද සටහන් කරමින් ජාතික යොවුන් සේනාංකය වෙත අයවැය ලේඛණයක් සකස් කිරීමට කටයුතු කරමි.
(ii) 13(7) වගන්තිය	වාර්ෂික වාර්තා කෙටුම්පත විගණිත 2025 ජුනි මස 16 දින වන විටත් ඉදිරිපත් කර නොමැති බව විමසුම මඟින් දක්වා ඇති අතර, 2024 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාවේ කෙටුම්පත මේ වන විට සකස් කරමින් පවතින බැවින් එය 2025 ජුලි මස 10 වන දිනට පෙර ලබා දීමට කටයුතු කරමි.

(ආ) පාරිතෝෂික

සේවයෙන් ඉවත්වන සියලු නිලධාරීන් හට ජාතික යොවුන් සේනාංකයේ යම් ප්‍රතිලාභයක් ලැබීමට තිබේ නම් අදාල නිෂ්කාශන කටයුතු සිදුකර ඒ සඳහා ඉදිරිපත් වන ලෙස සේවයෙන් ඉවත් වන අවස්ථාවේ සිටම දැනුම් දී ඇතත් සේවකයින් 37 න් 13 දෙනෙකු පමණක් මේ වන විට ප්‍රතිලාභ ලබා ගැනීමට ඉදිරිපත් වී ඇත. 24 දෙනෙකු තවදුරටත් 2018 වර්ෂයේ සිට මේ දක්වා අදාල නිෂ්කාශන කටයුතු සිදු කිරීමට හෝ හිමිකම් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ඉදිරිපත් නොවීමේ හේතුව මත පාරිතෝෂික ගෙවීම තවදුරටත් ප්‍රමාදව පවතී.

(ඇ) මු.රෙ. 371 (5)

කාර්යයන් සඳහා ලබා දෙන අත්තිකාරම් පියවීම සඳහා කාර්යය අවසන් වී දින 10 ක් ලෙස දක්වා ඇති අතර, ජාතික යොවුන් සේනාංකයේ දිවයින පුරාපිහිටි මධ්‍යස්ථාන වෙතින් එම වවුචර් පත් ලබා ගැනීම සඳහා සැලකිය යුතු කාලසීමාවක් ගත වන බැවින්, සහකාර අධ්‍යක්ෂ (පළාත්) වෙතින්ද නිර්දේශ ලබා ගත යුතු බැවින් අත්තිකාරම් පියවීම සඳහා දින 14 ක කාල සීමාවක් ලබා දී ඇති බව කාරුණිකව පෙන්වා දෙමි.

විමසුම මඟින් පෙන්වා දී ඇති දින 360 ක් ගත වී ඇති නමුත් පියවා නොමැති අත්තිකාරම මේ වන විට පියවා ඇති බව පෙන්වා දෙමි. එවක අත්තිකාරම් විෂය සිදු කල විෂය ලිපිකරු විදේශ ගත වීම සඳහා 2024 ජූලි මස 15 වන දින සේවයෙන් ඉවත්වී ඇත. එම නිළධාරී විසින් අත්තිකාරම් විෂයට අදාල නිශ්කාෂණයන්ද සිදු කර ඇත. එම අවස්ථාවේ දී විමසුම මඟින් පෙන්වා දී ඇති පියවීම් වවුචර්පත අස්ථාන ගතව ඇති බවට සොයා බැලීම් සිදු කිරීමේදී නිරීක්ෂණය විය.

2024 වර්ෂ අවසානයේ මෙම නොපියවා ඇති අත්තිකාරම පියවන ලෙස ලබා ගත් නිළධාරී වෙත ලිඛිත දැනුවත් 2024/12/31 දින සිදු කරන ලදී. එහෙත් එම වවුචර්පත පියවා ඇති බව සඳහන් කරමින් අදාල නිළධාරී විසින් නැවත ගිණුම් අංශය දැනුවත් කර ඇති බැවින්, නැවත නැවතත් එම වවුචර්පත පරීක්ෂාවට ලක් කරන ලදී.

එහෙත් එම වවුචර්පත් නොමැති බැවින්, තව දුරටත් පැරණි වවුචර්පත් ගොනු පරීක්ෂා කරන ලදී. අවලංගු කරන ලද පැරණි අත්තිකාරම් ගොනුවක් තුල තිබී පියවීමට ඇති මෙම වවුචර්පත සොයා ගන්නා ලදී. ඒඅනුව 2025 වර්ෂයේ එම වවුචර්පත පියවීම් සිදු කරන ලදී.

නිළධාරීන් 12 දෙනෙකු සඳහා ලබා දුන් අත්තිකාරම නොපියවා නැවත අත්තිකාරම් ලබා දී ඇති බව විමසුම මඟින් පෙන්වා දී ඇති නමුත් නැවත අත්තිකාරම ලබා දී ඇත්තේ එම සියළුම පියවීම් සිදු කිරීමෙන් අනතුරුව බව පෙන්වා දෙමි. අදාල විෂය ලිපිකරු විසින් නඩත්තු කර ඇති මෘදුකාංග පද්ධතියට එම පියවීම් දත්ත ඇතුලත් කර ඇති නමුත් අත්තිකාරම් ලේඛණයෙහි එම සටහන් යොදා ඇත්තේ වියදම සහතික කිරීමට ඉදිරිපත් කරන අවස්ථාවේදීය. ජාතික යොවුන් සේනාංකයේ මධ්‍යස්ථාන මට්ටමින්, පළාත් මට්ටමින් සහ මූලස්ථානයේ වරින් වර පැවැත්වෙන විවිධ වැඩසටහන් එකම කාල පරාසයක් තුල වීම හේතුවෙන් විශාල ප්‍රමාණයක අත්තිකාරම් ලබා දීමක් එක වර සිදු කල යුතු වේ. එකම විෂය ලිපිකරුවෙකු විසින් මෙම කාර්යයන් සියල්ලම සිදු කරන බැවින්, එම නිළධාරියා විසින් අත්තිකාරම කඩිනමින් ලබා දිය යුතු බැවින් එම පියවීම් ගිණුම් පද්ධතිය තුල පියවීමක් ලෙස ඇතුලත් කර නැවත ඉල්ලුම් කර ඇති අත්තිකාරම ලබා දෙනු ලබයි. තවද එවැනි වැඩසටහන් එනම් බඳවා ගනීම්, සහතිකපත් ප්‍රධානෝත්සව, ක්‍රීඩා උත්සව යනාදි වශයෙන් වූ විවිධ වැඩසටහන් රාශියක් පවත්වනු ලැබුවද රුපියල් 20,000/- හෝ ඊට වැඩි අත්තිකාරම් අයැදුම් කිරීමට හැකියාව ඇත්තේද මාණ්ඩලික නිළධාරීන් සඳහා පමණි. එවැනි නිළධාරීන් මධ්‍යස්ථාන මට්ටමින් ඇත්තේ සුළු ප්‍රමාණයක් බැවින්, ඉහත දක්වා ඇති පරිදි පියවීම් සිදු කර නැවත ලබා දෙන අත්තිකාරම් කඩිනිමින් ලබා දී ඇත. නමුත් ඉදිරියේදී පවතින ක්‍රමවේදය ඉවත් කර අනිවාර්යයෙන් අත්තිකාරම් ලේඛණයේ පියවීම් වවුචරය ඇතුලත් කර නව ඉල්ලුම් කිරීම සටහන් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.

එසේම නිළධාරීන් 20 දෙනෙකු විසින් ලබා ගෙන ඇති අත්තිකාරම් ඉහත දක්වා ඇති හේතූන් මත පියවීම් සටහන් ලේඛණයට ඇතුලත් කර නොතිබූ නමුත් අදාල කාල සීමාව තුල ගිණුම් පද්ධතිය මඟින් පියවීම් සිදු කර ඇති බව ඇමුණුම මඟින් පෙන්වා දෙමි. (ඇමුණුම 01)

(ඇ)

(i) 2024 වර්ෂයේ ජනවාරි මස සිට නොවැම්බර් මාසය දක්වා බැංකු සැසඳුම් වාර්තා අදාල කාල සීමාව ඇතුලත ලබා දී ඇති නමුත් දෙසැම්බර් මාසය තුල ගිණුම් තුලනය කිරීමේ කටයුතු සමඟ එම වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල බැංකු සැසඳුම් වාර්තාව ලබා දීම 2025 වර්ෂයේ පෙබරවාරි මස දක්වා ප්‍රමාද වූ බව පිළිගනිමි.

එහෙත් ඉදිරියේදී මෙම ප්‍රමාදය වලක්වා ගනිමින් නිශ්චිත දින වන විට බැංකු සැසඳුම් අදාල අංශයන් වෙත යොමු කිරීමට විෂය ලිපිකරුවන් දැනුවත් කරන ලදී.

(ii) 2024 වර්ෂයේ බැංකු සැසඳුම් වාර්තා පරීක්ෂා කිරීමේදී 2024 මාර්තු මාසය අවසන් වන විට ප්‍රේෂණපත් අංක 381236 මඟින් රු 368.00 ක වටිනාකම සහ අංක 381238 මඟින් රු 1140.00 ක වටිනාකම් ඇති ප්‍රේෂණපත් පමණක් මාස 06 ක කාල සීමාව ඉක්වා ඇති බව සඳහන් කරන අතර, එම ප්‍රේෂණපත් ද අප්‍රේල් මස වන විට නිශ්කාශනය කිරීමට පියවර ගෙන ඇති බව පෙන්වා දෙමි.

(ඊ)
(i) 2025 – 2029 කාල පරිච්ඡේදයට අදාලව සංශෝධනයන් මේ වන විට සිදු කරමින් පවතින අතර, අවසන් වාර්තාව සකස් කිරීමෙන් පසුව උපාය මාර්ගික සැලැස්මේ සංශෝධනයන් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(ii) 2010.12.14 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛනය අංක 55හි 15 ඡේදය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂයකට මාස තුනකට වරක් හෝ විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් පැවැත් විය යුතු වුවද ඒ සඳහා අවශ්‍ය විගණන හා කළමණාකරන කමිටුව නිසියාකාරව පත් නොවීම තුල වර්ෂය තුල අපේක්ෂිත කමිටු රැස්වීම් 04ම පැවැත්වීමට නොහැකි වුණි. (ජාතික යොවුන් සේනාංක සභාව වරින් වර වෙනස් වීම හේතුවෙන්) නමුත් විගණන හා කළමණාකරන කමිටුව ක්‍රියාත්මක කාලසීමාව තුල 2024 වර්ෂයට අදාලව කමිටු රැස්වීම් 02ක් පවත්වා ඇති අතර, එහිදී ගනු ලැබූ තීරණයන් සහ සාකච්ඡා වූ කරුණුවලට අදාල රැස්වීම් වාර්තා ද නිකුත් කර ඇත.

2024 වර්ෂයට අදාලව පළමු සහ දෙවන කාර්තුන්ට අදාලව පහත සඳහන් දිනයන්හිදී විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් පවත්වා ඇත.

2024 පළමු කාර්තුව - 2024.06.18 වන දිනත්,

2024 දෙවන කාර්තුව - 2024.09.18 වන දිනත්,

ඒ අනුව 2023.12.20 වන දින කමිටු සාමාජිකයින් ඉවත්වීම හේතුවෙන් නව කමිටු සාමාජිකයින් පත් කරලීමේ ප්‍රමාදය තුල 2024 පළමු කාර්තුවට අදාල රැස්වීම ප්‍රමාද වී පැවැත්වීමට සිදු වූ අතර, එම ප්‍රමාදය හේතුවෙන් දෙවන කාර්තුවට අදාල රැස්වීම 2024.09.18 දිනට පවත්වන්නට යෙදුණි. නමුත් උක්ත රැස්වීමෙන් අනතුරුව 2024.09.21 වන දිනෙන් පසුව පත් කරන ලද කමිටු සාමාජිකයින් ඉවත්වීම හේතුවෙන් සහ එම වර්ෂය තුල නව කමිටු සාමාජිකයින් පත් නොකිරීම හේතුවෙන් ද ඉතිරි විගණන කළමණාකරන කමිටු රැස්වීම් දෙක පැවැත්වීමට නොහැකි වුණි.

එමෙන්ම 2025 වර්ෂයට අදාලව පළමු කාර්තුව සඳහා වන විගණන හා කළමණාකරන කමිටුව පත් කරලීමද ප්‍රමාද වීම හේතුවෙන් 2025 පළමු විගණන හා කළමණාකරන කමිටු රැස්වීම පැවැත්වීම 2025.05.21 වන දින දක්වා ප්‍රමාද වීම් සිදු වූ බව ද මේවන විට දෙවන කාර්තුවට අදාල රැස්වීම

2025.07.02 වන දින පැවැත්විය. තවද, ඉදිරි කාලසීමාව තුල වර්ශයට අදාලව පැවැත්විය යුතු ඉතිරි කමිටු රැස්වීම් දෙක පැවැත්වීමට අදාලවද සැලසුම් සකස් කර ඇති බව පෙන්වා දෙමි.

2.2.3

බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂන
(අ)	නව ජාතික යොවුන් සේනාංක සභාවේ කටයුතු ආරම්භ කර දෙවන රැස්වීම්වාරය 2025/06/25 වන දින පැවතුනි. 2002 අංක 21 දරන යොවුන් සේනාංක පනතේ 2(4) වගන්තිය යටතේ කමිටු පත් කිරීමේ කටයුතු සභාවේ උපදෙස් පරිදි සිදු කරමින් පවතින අතර ඉදිරි සභාවාරය සඳහා කමිටු සාමාජිකයින් සඳහා බාහිර ආයතනවලින් පත් කළ යුතු අය සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දෙන ලෙසට උපදෙස් ලබා දුන්නා.
(ආ)	ජාතික යොවුන් සේනාංක අධිකාරී පනත් කෙටුම්පත් ප්‍රගතිය පහත පරිදි ඉදිරිපත් කල හැක.

මෙම පනත් කෙටුම්පත දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පනවන ලද කිසිදු තහනමකට හෝ සීමාවකට යටත් නොවන අතර එය පාර්ලිමේන්තුව විසින් බලාත්මක කළ හැකි බවට නීතිපති විසින් සහතිකයක් ලබා දී ඇත.
යොවුන් සේනාංකය තුළ Youth Green Climate Corps වෙනම ම වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි යොවුන් සේනාංක අධිකාරී පනතට ඇතුලත් කිරීමට කටයුතු කරන ලෙසට උපදෙස් ලබා දී ඇත.

ඒ සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ සහාය සහ මාර්ගෝපදේශය ලබා ගැනීම සඳහා ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිඛිත දැනුවත් කිරීම් සිදු කර ඇත. ඒ අනුව,
දැනටමත් සකස් කරන ලද කෙටුම්පතට එවැනි සංශෝධනයක් කිරීම සඳහා කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය මුල සිටම සිදු කළ යුතු බවත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු බවටත් දැනුම් දෙමින් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් ලිඛිත දැනුවත් කිරීමක් සිදු කර ඇත. එබැවින්, ඒ සඳහා අවශ්‍ය සහාය ඉල්ලමින් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉල්ලීමක් සිදු කරන ලදී.

එම කරුණු වැඩිදුර අධ්‍යයනය කිරීම සඳහා කල් තබන ලද බවට අංක අමප/22/2194/624/013 හා 2023/01/17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම් දීමේ ලිපිය මගින් දැනුවත් කර ඇත.නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි පනත් කෙටුම්පත නීතිගත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලමින් ලේකම් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය වෙත නැවත ඉල්ලීමක් සිදු කර ඇත. දැනට ක්‍රියාත්මක වන සියලුම වෘත්තීය පුහුණු ආයතන තනි ආයතනයක් යටතේ ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳව රජය කරුණු අධ්‍යයනය කරන බැවින් යොවුන් සේනාංක අධිකාරී පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අදාල සංදේශය සලකා බැලිය යුතු බවට අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම් දීමක් සිදු කර ඇත.

2.2.4

2.3 වෙනත් කරුණු

(අ) මීගහකිවුල හා වැලිමඩ මධ්‍යස්ථාන ඉදිකිරීම් වෙනුවෙන් D.K.S CONSTRUCTION AND ENGINEERING (PVT) LTD ආයතනය වෙත ලබාගත අත්තිකාරම් මුදල් පිලිවෙලින් රු.19,662,001.35ක හා රු.19,259,019.78 හි වත්මන් තත්ත්වය.

මෙම මුදල නැවත ලබා ගැනීම සම්බන්ධයෙන් වන නීතිමය ක්‍රියාවලිය මේ වන විටත් සිදුවෙමින් පවතින අතර මෙම නීතිමය කටයුතු සඳහා ගරු නීතිපති තුමාගේ උපදෙස් ලබා ගැනීමට ජාතික යොවුන් සේනාංකය කටයුතු යොදන ලදී.
ඒ අනුව මෙම මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් නීතිපති තුමාගේ උපදෙස් පරිදි නීතිමය කටයුතු (Arbitration) සිදු කරමින් පවතින අතර එහි ආසන්නතම සාකච්චාව 2025.05.23 දින පැවත් වූ අතර ඉදිරි සාකච්චා වටය 2025.07.04 පැවැත්වීමට නියමිතව ඇති බව දන්වා සිටිමි. එහි අවසන් තීරණය ලබාදුන් පසු ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි.
පැල්මඩුල්ල පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලැබූ K S Construction and Engineerin (PVT) Ltd ආයතනය රු.15,018,460.81 ක හිඟ අත්තිකාරම් ජාතික යොවුන් සේනාංකය වෙත ගෙවීමට කටයුතු සිදු කරන මෙන් NYC/CONST/CAP/F/2024( ) හා 2024.08.08 දිනැති ජාතික යොවුන් සේනාංක අතිරේක අධ්‍යක්ෂකගේ ලිපිය මගින් කොන්ත්‍රාත්කරු දැනුවත් කර ඇත. එම ලිපිය සඳහා ප්‍රතිචාර නොමැති බැවින් NYC/CONST/CAP/F/2024 හා 2025.04.08 දිනැති ලිපිය මගින් නැවත වරක් කොන්ත්‍රාත්කරු දැනුවත් කර ඇති අතර ඒ අනුව තවදුරටත් එම මුදල් පියවීමට අපොහොසත් වුවහොත් ඉදිරියේදී නීතිමය කටයුතු සිදු කිරීමට නියමිත බව එම ලිපිය මගින් කොත්‍රාත්කරු දැනුවත් කර ඇති බව දන්වා සිටිමි.

ජාතික යන්ත්‍රෝපකරණය ආයතනය (NEMO) විසින් සිදුකරන ලද ඉදිකිරීම් වෙනුවෙන් එම ආයතනය විසින් ජාතික යොවුන් සේනාංකය වෙතින් ලබා ගත් අත්තිකාරම් මුදලින් රු.37,615,679.51 ක මුදලක් ලබා දිය යුතුව ඇති අතර එම ඉදිකිරීම් වෙනුවෙන් රදාවාගත් රැඳවුම් මුදල් ලෙස රු. 1,866,990.93 ක මුදල ඉහත අත්තිකාරම් මුදලින් අඩු කර ගැනීම සඳහා සභා පත්‍රිකාව සකස් කර ඉදිරිපත්කර ඇති අතර ඒ සඳහා සභා අනුමැතිය ලැබී ඇති බැවින් ඉහත අත්තිකාරම් මුදලින් රැඳවුම් මුදල අඩු කරගත් පසු ඉතිරි මුදල වන රු.35,748,688.58 මුදල නිරවුල් කිරීම සම්බන්ධව 2025.05.14 දින පැවති සභා රැස්වීමෙන් ගත් තීරණය අනුව යොවුන් සේනාංක සභාවේ සභාපතිගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශ ඉංජිනේරු මහතා හා ජාතික යොවුන් සේනාංක තාක්ෂණ නිලධාරී මහතා ඇතුලත්ව කමිටුවක් පත්කර වාර්ථාවක් සකස් කිරීමට නියමිතය. එම වාර්ථාවේ නිර්දේශයන්ට අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට උපදෙස් ලබා දෙන ලදී.

කොටපොල පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලැබූ Ranweli Construction ආයතන විසින් ලබාගත් රු. 6,985,139.29 ක අත්තිකාරම් මුදල ජාතික යොවුන් සේනාංකය වෙත ගෙවා නිරවුල් නොකිරීම හේතුවෙන් නීතිපතිතුමාගේ උපදෙස් පරිදි කොන්ත්‍රාත්කරුට එරෙහිව නීතිමය කටයුතු අරාම්භ කර ඇත.එම නීතිමය කටයුතු සඳහා අංක NYC/CONST/CAP/F/24(46) හා 2025.03.14 දිනැති ලිපිය මඟින් කොටපොල ප්‍රාදේශීය ලේකම් වෙත, 2017 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කර වැඩ අවසන් නොකල කොටපොල පුහුණු මධ්‍යස්ථානයේ ගොඩනැගිලි සඳහා 2017 වර්ෂයේ BSR ගණනයන්ට අනුව නැවත තක්සේරු වාර්ථාවක් ලබා දෙන මෙන් දන්වා සිටින් ලදි. කොටපොල ප්‍රාදේශීය ලේකම්ගේ අංක KOT/DEV/OTHER/02/01 හා 2025.05.15 දිනැති ලිපිය මගින් කොටපොල පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් අධීක්ෂණය කල ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සතුව අදාල ඇස්තමේන්තු හා සැලසුම්පත් පවතින බැවින් එම අධීක්ෂණ ආයතනය මගින් වාර්ථාව ලබා ගැනීම සුදුසු බව දන්වා එවන ලදී. එහෙත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙතින් එම වාර්ථාව

ලබා ගැනීමට ප්‍රමාද වන බැවින් ජාතික යොවුන් සේනාංක තාක්ෂණ නිලධාරී මහතා මගින් සකස් කිරීමට අවඇසි කටයුතු සිදු කරමින් පවතී. තවද ජාතික යොවුන් සේනාංක පස් අවුරුදු සැලැස්ම යටතේ 2027 වර්ෂයේ දී ඉදිකිරීම් කටයුතු කිරීමට යෝජනා කර ඇති බව දන්වා සිටිමි.

ගෝමරන්කඩවල පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලැබූ USS Engineering ආයතනය විසින් ඉදිකිරීම් වෙනුවෙන් ලබාගෙන ඇති රු.1,083,340.99 ක මුදල ජාතික යොවුන් සේනාංකය වෙත ගෙවා නිරවුල් නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුට එරෙහිව නීතිමය කටයුතු ආරම්භ කර ඇත. කොළඹ වංචා විමර්ශන කාර්යාංශයේ ඒකක 06 වෙත කරන ලද පැමිණිල්ලට අනුව මෙම නීතිමය කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා මෙම මධ්‍යස්ථානයේ දැනට ඉදිකිරීම් සිදුකර ඇති ප්‍රමාණය සම්බන්ධව 2017 වර්ෂයේ BSR ගණනයන්ට අනුව තක්සේරු වාර්ථාවක් ලබා දෙන මෙන් කොළඹ වංචා විමර්ශන කාර්යාංශය මගින් දන්වා එවා ඇත. ඒ අනුව 2017 වර්ෂයේ BSR ගණනයන්ට අනුව තක්සේරු වාර්ථාව සකසා දෙන මෙන් ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් ගෙන් ලිපියක් මගින් ඉල්ලීම් කර ඇත. එයට ප්‍රතිචාරයක් ලැබී නොමැති බැවින් එම තක්සේරු වාර්තාව ජාතික යොවුන් සේනාංක තාක්ෂණ නිලධාරී මහතා මගින් සකස් කිරීමට අවැසි කටයුතු සිදුකරමින් පවතී.

Sevana Builders ආයතනය විසින් හලාවත (මාදම්පේ) පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වෙනුවෙන් ජාතික යොවුන් සේනාංකය රඳවා ඇති රු. 1,818,174.53 ක රැදවුම් මුදලින් දැනට ඉතිරිව පවතින රු. 239,976.98 ක මෙම අත්තිකාරම් මුදල එම ඉදිකිරීම් සම්බන්ධ අවසන් බිල්පත ලැබීමෙන් පසු අඩු කර ගැනීමට කටයුතු සිදු කිරීමට නියමිතය. නමුත් මේ වන තෙක් අවසන් බිල්පත අප වෙත ලැබී නොමැති බව කාරුණිකව දන්වා සිටිමි.

(ආ) රු.111,819,300.00 ක වටිනාකමකින් යුත් වර්ෂ 08 ක කාලයක් පුරා ඉදිකිරීම් කටයුතු අතහැර දමා පැවති පුහුණු මධ්‍යස්ථාන පහත පරදි වේ.

අනු අංකය	මධ්‍යස්ථානය	මුදල රු.
01	අත්තනගල්ල	4,449,252.00
02	වැලිඔය	32,779,730.00
03	නවින්දන්වේලි	32,961,619.00
04	නුවරඑළිය	12,207,212.00
06	රඹෑව	10,665,502.00
07	කොටපොල	18,755,985.00
	එකතුව	**111,819,300.00**

ඉහත පුහුණු මධ්‍යස්ථානයන් හී ඉදිකිරීම් වෙනුවෙන් රු.111,819,300.00 ක මුදල එම අවස්ථාවේ සිදු කර ඇති ඉදිකිරීම් ප්‍රමාණය වෙනුවෙන් අනු අංක 01 සිට 06 දක්වා NEMO ආයතනය වෙතත් කොටපොල ඉදිකිරීම් වෙනුවෙන් රන්වැලි කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත ගෙවා ඇති මුදලක් වන බවත්, එම වටිනාකම් අයකර ගැනීමට ඇති මුදලක් නොවන බව පෙන්වා දෙමි.

(ඇ) ජාතික යොවුන් සේනාංකයේ 2025 පළමු කාර්තුව වන විට පුරප්පාඩුව පැවති අත්‍යාවශයෙන්ම බඳවා ගත යුතු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට අමාත්‍යාංශය වෙතින් කරන ලද ඉල්ලීමට අනුව MOYS/ADM/4/3/6 දරන 2025.05.29 දිනැති ලිපියට මඟින් පුරප්පාඩුව පවතින පහත දක්වා ඇති තනතුරු සඳහා බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇත. ඒ අනුව 2025.06.03 දින එම තනතුරු සඳහා බඳවා ගැනීමට අදාලව පුවත්පත් දැන්වීමක් පළකර අයදුම්පත් කැඳවා ඇති අතර ඉදිරි කාලය තුල සම්මුඛ පරීක්ෂණ 2025.07.08 සහ 09 වන් දින වලදී පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇත.

සහකාර අධ්‍යක්ෂ (පුහුණු)	01
සහකාර අධ්‍යක්ෂ (පළාත්)	06
මධ්‍යස්ථානාධිපති	17
තොරතුරු තාක්ෂණ උපදේශක	17
ඉංග්‍රීසි භාෂා උපදේශක	15

අනිකුත් තනතුරු සඳහා බඳවා ගැනීමට අදාලව රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්ගේ සභාපතිත්වයෙන් නව කමිටුව වෙත අනුමැතිය සඳහා යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර කර ඇත.

(ඈ) 2024 වර්ෂයේදී මානව සම්පත් අවශ්‍යතා හඳුනාගෙන සැලසුම් සකස් කර නොමැති බව පිළිගනිමි. එනමුත් 2025 වර්ෂයේදී 2024 හා 2025 යන වර්ෂයන් සඳහා අවශ්‍ය මානව සම්පත් සහ නව තනතුරු හඳුනා ගැනීමත් එම තනතුරු සඳහා අවශ්‍ය කුසලතා හඳුනා ගනිමින් ඉදිරි වර්ෂය සඳහා වූ නව සැලසුම් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(ඊ) ජාතික යොවුන් සේනාංක බඳවා ගැනීම් පරිපාටිය 2011 සහ 2018 වර්ෂයන්හිදී අවස්ථා 02 දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව සංශෝධනය කර ඇත. 2025 වර්ෂයේදී ජාතික යොවුන් සේනාංකය විසින් හඳුනාගත් නව අවශ්‍යතාවයන් සහ වර්තමානයට ගැලපෙන පරිදි බඳවා ගැනීම් පටිපාටිය සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර මේ වන විට ආරම්භ කර අවසන් අදියර දක්වා ළඟා වී ඇත.

එමෙන්ම ජාතික යොවුන් සේනාංකය වෙත 2011 වර්ෂයේ කාර්යය මණ්ඩලය අනුමත කිරීමේදී DMS/E3/21/5162/2 දරන 2011.04.06 දිනැති ලිපිය මඟින් ජාතික යොවුන් සේනාංකයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වන සහකාර අධ්‍යක්ෂ (පළාත්) තනතුරු 09 ක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට පහත සුදුසුකම් වලට යටත්ව අනුමැතිය ලබා දී ඇත.

සහකාර අධ්‍යක්ෂ (පළාත්)තනතුරට බඳවා ගැනීම් සඳහා අනුමත වී ඇති බඳවා ගැනීම් පරිපාටියට අනුව මෙම තනතුර සඳහා හුදෙක්ම අවුරුදු 03 ක උපරිම කාලයකට යටත්ව කොන්ත්‍රාත් පදනම් මත බඳවා ගනු ලැබේ.

- සාමාන්‍ය උපාධිය සමග ශ්‍රී ලංකා යුධ හමුදාවේ මේජර් නිලයකට හෝ ගුවන් / නාවික හමුදාවේ ඊට නොඅඩු නිලයක අවම අවුරුදු 03ක සේවා කාලයක් සපුරා තිබීම හෝ
- ශ්‍රී ලංකා යුධ හමුදාවේ ලුතිතන් කර්නල් තනතුරට හෝ එම තනතුරට නොඅඩු නාවික / ගුවන් හමුදාවේ නිලයක වසර 05ක සේවා කාලයක් සපුරා තිබීම හෝ
- දීප ව්‍යාප්ත සේවාවක බඳවාගැනීම් ශ්‍රේණියේ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හෝ

- පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත්උපාධියක් සහිතව රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක කළමනාකාර මට්ටමේ අවුරුදු 05ක පළපුරුද්ද සුදුසුකම් වන අතර බඳවා ගන්නා දිනට වයස අවුරුදු 50 නොඉක්මවිය යුතුය.

ඒ අනුව බඳවා ගැනීම් පරිපාටියට අනුකූලව සම්මුඛ පරීක්ෂණ පවත්වා අදාල සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් බඳවා ගැනීමට කටයුතු කර ඇත.

(උ) ජාතික යොවුන් සේනාංක සභාපතිතුමන්ගේ ප්‍රවාහන රාජකාරි කටයුතු සඳහා වාහන සංචිතයේ සුදුසු වාහනයක් නොමැති වූ බැවින් අයවැය වක්‍රලේඛ අංක 01/2016 අනුව මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වසර 05ක කාලයක් සඳහා CBM-2579 අංක දරණ කාර් රථය ලබාගෙන ඇත. එම වක්‍රලේඛයෙන් ඉදිරිපත් කර ඇති ගිවිසුම අනුව Westcoast (Pvt) Ltd ආයතනය සමග මාසිකව කි.මී 3,000ක ධාවනය සඳහා රු.300,000.00 ක මුදලකට ගිවිසුම් ගත වී ඇත.

එහෙත් 2024 වර්ෂයේදී හිටපු සභාපතිවරුන්ගේ රාජකාරි අවශ්‍යතාවයන් සඳහා ධාවනය කර ඇත්තේ කි.මී 11,836 ක පමණ දුරකි. විමසුම මඟින් පෙන්වා දී ඇති පරිදි ධාවනය කල කි.මී ප්‍රමාණයට අනුව පමණක් ගෙවීම් සිදු කිරීමට ගිවිසුම් ගත වී නොමැති බැවින්, එම ගිවිසුම් ප්‍රකාරව මාසික කුලිය වන රු.300,000.00 ක මුදලක් වශයෙන් ගෙවීම් සිදු කර ඇති බව පෙන්වා දෙමි.

(ඌ) 2019 වර්ෂයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ රාජකාරී කටයුතු සඳහා ජාතික යොවුන් සේනාංකය සතුව තිබූ ත්‍රිරෝද රථ 03 ක් ලබා දෙන ලදී. එම ත්‍රිරෝද රථ අතුරින් ත්‍රී රෝද රථ 02 නැවත ජාතික යොවුන් සේනාංකය වෙත භාර දෙන භාර දීම් සිදු කර නොතිබිණි. 2025/06/16 වන දින අදාල අංශය වෙතින් විධිමත් පරිදි එම ත්‍රී රෝද රථ 02 නැවත භාර දීම සිදු කර ඇති බැවින්, එය යොවුන් සේනාංක වාහන සංචිතය වෙත ඇතුලත් කර ගැනීම මේ වන විට සිදු කර ඇත.

(එ) පුහුණු පාඨමාලා කාර්යසාධනය

(i) 2024 වර්ෂය සඳහා ජීවන කුසලතා පාඨමාලාව සඳහා බඳවාගත් youth cadet වරුන් සංඛ්‍යාව කණ්ඩායම් වශයෙන් පහත සඳහන් පරිදි වේ.

අනු අංකය	වර්ෂය	ලියාපදිංචි ප්‍රමාණය	පාඨමාලාව හැර ගිය ප්‍රමාණය	පාඨමාලාව අවසන් කළ ප්‍රමාණය
1	2024 - I කණ්ඩායම	3664	1056	2608
2	2024 - II කණ්ඩායම	3823	1195	2628
3	2024 - III කණ්ඩායම	1366	205	1161
එකතුව		8853	2456	6397

ඒ අනුව, ඔබ වෙතින් යොමු කර ඇති විගණන වාර්තාවෙහි සඳහන් පාඨමාලාව හැර ගිය ප්‍රමාණය 2456 ක් ලෙස නිවැරදි විය යුතු අතර, එය ප්‍රතිශතයක් ලෙස 27% කි.

ජාතික යොවුන් සේනාංක ජීවන කුසලතා පාඨමාව සඳහා වැඩිපුර youth cadet ප්‍රමාණයක් පාඨමාලාව සඳහා ලියාපදිංචි වනු ලබන්නේ අ.පොෂ (සා.පෙළ) විභාගය අවසන් වූ පසු බදවා ගනු ලබන කණ්ඩායම සඳහාය. 2024 වර්ෂයේ ii කණ්ඩායම සඳහා ලියාපදිංචි වූ youth cadet වරුන් බහුතරයක් අ.පොෂ (සා.පෙළ) විභාගය සඳහා මුහුණ දුන් සිසුන් විය. එසේ ළමුන් ලියාපදිංචි වූ පසු අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් අ,පොෂ (උ /පෙළ) පන්ති සඳහා නැවත පාසල් වෙත පැමිණෙන ලෙස නිවේදනය කරන ලදී. එම හේතුව නිසා ජීවන කුසලතා පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ අ.පොෂ (සා / පෙළ) ට මුහුණ දුන් සිසුන් නැවත පාසල් වෙත ගිය බැවින් එම කණ්ඩායමේ පාඨමාලාව හැර යාමට සෘජුවම එය බලපාන ලදී.

ජාතික යොවුන් සේනාංක පාඨමාලාව සඳහා ලියාපදිංචි වන youth cadet වරුන් පාඨමාලාව හැර යාම සඳහා බලපාන ලද එක් ප්‍රධාන කාරණයක් ලෙස පුහුණු මධ්‍යස්ථානා ප්‍රධාන නගරයෙන් බැහැරව දුෂ්කර ප්‍රදේශවල පිහිටා තිබීම දැක්විය යුතුය. මෙම හේතුව නිසා ප්‍රවාහන අපහසුතා පැවතීම සිසුන් පාඨමාලාව හැර යාමට බලපාන ලද එක් ප්‍රධාන සාධකයකි.මෙයට විසඳුමක් ලෙස youth cadet වරුන් සඳහා පැමිණීමේ දීමනාවක් ලබා දීම සිදු කරනු ලැබුවද එම දීමනාව ප්‍රමාණවත් නොවීම සඳහා බස්රථ නොමැති කම යන කාරණා මේ සඳහා බලපෑ ඇත.

youth cadet වරුන් පාඨමාලව හැරයාමට හේතු මාසිකව ලබා ගන්නා අතර අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා ඇමුණුම 02 ලෙස දක්වා ඇත.

එමෙන්ම මාස 06 ක වැනි දිර්ඝ කාලින පාඨමාලාවක් වීම youth cadet වරුන් පාඨමාලව හැර යාමට බලපාන ලද තවත් එක් ප්‍රධාන සාධකයකි. මෙලෙස පාඨමාලාව හැර යෑමේ ප්‍රතිශතය අවම කිරීම සඳහා මේ වන විට ජාතික යොවුන් සේනාංකය මඟින් ජීවන කුසලතා පාඨමාලව මාස 03 1/2 ක කෙටි කාලින නේවාසික පාඨමාලාවක් ලෙස පැවැත්වීමට මේ වන විට කටයුතු සැලසුම් කර ඇති අතර, නියමු ව්‍යාපෘතියක් ලෙස මේ වසරේදී එක් මධ්‍යස්ථානයක ක්‍රියාත්මක කිරීමට නියමිතය.

මේ මඟින් ජාතික යොවුන් සේනාංකය සතු මානව සම්පත ඵලදායි ලෙස දායක කර ගැනීම සඳහා කෙටිකාලින වෙනත් පාඨමාලා මේ වන විටත් මධ්‍යස්ථාන මට්ටමින් ආරම්භ කර පවත්වාගෙන යනු ලබයි.

(ii) ජාතික යොවුන් සේනාංකය මඟින් පවත්වනු ලබන ජීවන කුසලතා පාඨමාලාවට අදාලව නිකුත් කරනු ලබන සහතිකපත් මුද්‍රණය, සහතිකපත් බෙදා දීම ආදී සමස්ත ක්‍රියාවලිය 2023 වර්ෂයේ සිට පුහුණු අංශය මඟින් සිදු කරනු ලබයි. මූලික පාඨමාලාව සාර්ථකව අවසන් Youth Cadet වරුන් සඳහා නිකුත් කරනු ලබන සියලුම සහතිකපත් සියල්ල පළාත් කාර්යාල වෙත නිකුත් කරන ලෙස එවකට සිටි අධ්‍යක්ෂවරයා උපදෙස් ලබා දෙන ලදී.

ඒ අනුව, පළාත් කාර්යාල වෙතින් තම පලාතට අයත් මධ්‍යස්ථාන වලට අවශ්‍ය සහතිකපත් ප්‍රමාණය පුහුණු අංශය වෙත යොමු කරන ලෙස උපදෙස් ලබා දුන් පසු පලාතට අවශ්‍ය සියලු සහතිකපත් වල අවශ්‍ය ප්‍රමාණයන් පළාත් අධ්‍යක්ෂ වරයාගේ අත්සනින් පුහුණු අංශය වෙත යොමු කරනු ලබයි.

අධ්‍යක්ෂවරයා ලබා දුන් උපදෙස් පරිදි මුද්‍රා තබන ලද සහතිකපත් පළාත් කාර්යාල මඟින් ඉල්ලුම් කරන ලද ප්‍රමාණයන්ට අනුව පළාත් කාර්යාල වෙත කුරියර් කරන ලදී. (මධ්‍යස්ථාන කාර්යය මණ්ඩල මූලස්ථානය වෙත සහතිකපත් රැගෙන යාමට පැමිණීමේදී සිදු වන කාලය සහ මුදල් නාස්තිය අවම කිරීම)

එසේ පළාත් කාර්යාල වලට සහතික පත් යොමු කළ පසු සහතිකපත් නිසිපරිදි නිකුත් කිරීම පළාත් අධ්‍යක්ෂ වරයාගේ පූර්ණ වගකීම වේ. එමෙන්ම ඉතිරි සහතික පත් පවතී නම් නැවත පළාත් කාර්යාල වලට ගෙන්වා ගැනීම සහ ඊලඟ කණ්ඩායමේ පාඨමාලාව සාර්ථකව අවසන් කරන youth cadet වරුන් සඳහා එම සහතිකපත් ලබා දීම පළාත් අධ්‍යක්ෂ වරයාගේ පූර්ණ වගකීම වේ.එහිදී සහතිකපත් නිවැරදි ක්‍රමවේදයට නිකුත් කිරීමේ වගකීම පළාත් අධ්‍යක්ෂ වරයා වෙත පවරා ඇත.

පුහුණු හා සංවර්ධන චක්‍රලේඛ - 06 (1) 2023 පුහුණු අංශය (විසිර යාම) ව්‍යතිරේක චක්‍රලේඛය (ඇමුණුම 03)

මධ්‍යස්ථාන විසිර යාමේ උත්සවයෙදී විසිර යන youth cadet වරුන් සහ වරියන් සඳහා සහතිකපත් ලබා දිය යුතු බැවින් මධ්‍යස්ථාන විසිරයාමේ උත්සවය පැවැත්වීමට පෙර මධ්‍යස්ථාන වෙත සහතිකපත් ලබා දීම සිදු කළ යුතුය. එමෙන්ම සහතිකපත් youth cadet වරුන් අතර, බෙදා දුන් පසු ඔවුන් ලබා ගන්නා ලද සහතිකපත් පිළිබඳ විස්තර "youth cadet වරුන්ගේ විස්තර ලබා ගැනීම සඳහා යොමු කර ඇති outlook පැතුරුම් පතෙහි" ලබාගත් සහතික වර්ගය සහ සහතිකපත් අංකය ඇතුළත් කිරීමට තීරු ඇතුළත් කර ඇත.

මේ වන විටත් 2024 වර්ෂයේ i සහ ii කණ්ඩායමට අදාලව youth cadet වරුන්ට ලබා දීමට යොමු කරන ලද සහතිකපත් වලින් මධ්‍යස්ථාන සතුව ඉතිරි වූ සහතිකපත් කොපමණ ප්‍රමාණයක් පවතීද යන්න පිලිබඳව outlook පැතුරුම් පතක් යොමු කර ඉතිරි සහතිකපත් ප්‍රමාණ ලබා ගෙන ඇත. (ඇමුණුම 04)

2025 වර්ෂයේ සහතිකපත් ලබා දීමට පෙර 2024 iii කණ්ඩායම සඳහා බෙදා දීමට ලබා දුන් සහතිකපත් වල ඉතිරි ප්‍රමාණයන් ලබා ගැනීම සිදු කරනු ලබයි. ඉදිරියේදී නිකුත් කරනු ලබන සහතිකපත් අභ්‍යන්තර විගණන මඟින් හඳුන්වා දී ඇති විධිමත් ආකෘතින්ට අනුව තවදුරටත් නිකුත් කිරීමට කටයුතු කරනු ලබන ඔබ වෙත දන්වා සිටිමි.

මේ වන විට තොරතුරු කළමනාකරණ පද්ධතිය හඳුන්වා දී ඇති බැවින් youth cadet වරුන් සඳහා ලබා දෙනු ලබන සියලු සහතිකපත් වල විස්තර එම දත්ත පද්ධතියට ඇතුළත් කරන බැවින් අවභාවිතා සහ අවිධිමත් භාවය සිදු වීම අවම මට්ටමක පවතින ඔබ වෙත දන්වා සිටිමි.

iii) ජාතික යොවුන් සේනාංකය සමාලෝචිත වර්ෂයේ වෘත්තීය පුහුණුව සඳහා යොමු කරනුයේ ඊට පෙර වර්ෂයේ ජීවන කුසලතා පුහුණුව අවසන් කරනු ලැබූ යුත්කැඩෙට්වරුන්ය. එනම්, 2024 වර්ෂය තුල වැඩිමනක් වෘත්තීය පුහුණුව සඳහා යොමු කර ඇත්තේ 2022/23 වර්ෂ තුල ජීවන කුසලතා පුහුණුව අවසන් කරනු ලැබූ යුත්කැඩෙට්වරුන්ය.

2023/24 වර්ෂවල වෘත්තීය පුහුණුවට යොමු කිරීමේ මූලය ප්‍රගතිය පහත පරිදි වේ.

වර්ෂය	මූල්‍ය ප්‍රගතිය		
	වර්ෂය තුල වෙන් කල මුදල්	දැරූ වියදම	ප්‍රතිශතය %
2023	27,000,000	4,394,210	16.27%
2024	26,400,000	23,236,730	88.02%

2023 වර්ෂයේ වෘත්තීය පුහුණු මූල්‍ය ප්‍රගතිය 16.27% ක අඩු ප්‍රතිශතකමය අගයක් ලබා ඇත. එයට හේතුව වුයේ 2023 වර්ෂයේ වෘත්තීය පුහුණුව සඳහා යොමු වනුයේ 2021/22 වර්ෂ තුල ජීවන කුසලතා පුහුණුව අවසන් කරනු ලැබූ යුත්කැඩෙට්වරුන් වන බැවින් එම වර්ෂවල පැවති කොරෝනා වසංගත තත්ත්වය සහ රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් යුත්කැඩෙට්වරුන් වැඩි පිරිසක් වෘත්තීය පුහුණුව සඳහා යොමු නොවීමයි. එම නිසා 2023 වර්ෂයේ අපේක්ෂා කල තරම් මූල්‍ය ප්‍රගතියක් ළඟා කර ගැනීමට නොහැකි වී ඇත.

එනමුත්, සමාලෝචිත 2024 වර්ෂය වන විට අනුමත ක්‍රියාකාරී සැලැස්ම මගින් වෘත්තීය පුහුණු ප්‍රතිපාදන වටිනාකම රු 26.400,000ක් විය. එම වර්ෂයේ යුත්කැඩෙට්වරුන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම වෙනුවෙන් රු 23,236,730ක මුදලක් වැය දරමින් 88% ක ඉහළ ප්‍රතිශතාත්මක මූල්‍ය ප්‍රගතියක් අත් කර ගැනීමට යොවුන් සේනාංකය සමත් වී ඇත.

යොවුන් සේනාංකය සෑම වර්ෂයකම විධිමත් සැලැස්මකට අනුව යුත් කැඩෙට්වරුන් වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීම සිදු කරනු ලබයි, එනම්, සෑම වර්ෂයකම යෝග්‍යතා පරීක්ෂණයකට අනුව, මධ්‍යස්ථාන මට්ටමින් රු ලක්ෂ තිහක උපරිම මුදලකට යටත්ව වෘත්තීය පුහුණුව සඳහා යුත්කැඩෙට්වරුන් යොමු කිරීමට තෝරා ගනු ලබයි. මෙහිදී, යුත්කැඩෙට්වරුන්ගේ අධ්‍යාපන මට්ටම, ඔවුන්ගේ කැමැත්ත, සහ ඔවුන්ගේ ආර්ථික දුෂ්කරතාව මත ප්‍රාදේශීය වශයෙන් යොමු කිරීමට හැකි ආසන්නතම හා නියමිත සුදුසුකම් සපිරූ වෘත්තීය පුහුණු ආයතන/පාඨමාලාව යන කරුණු පාදක කර ගනිමින් වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීම සිදු කරනු ලබයි.

ඉහත කරුණු සලකා බලමින් සමාලෝචිත 2024 වර්ෂය සඳහා පුහුණුලාභීන් 1000ක ප්‍රමාණයක් යොමු කිරීමට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මගින් සැලසුම් කරන ලදී. ඒ අනුව, 2024 වර්ෂයේ වෘත්තීය පුහුණු සැලසුම් අනුව තත්‍ය වශයෙන් 1201ක සංඛ්‍යාවක් යොමු කරමින් අපේක්ෂිත ප්‍රගතිය ලබා ඇත. 2024 වර්ෂයේ අනුමත ක්‍රියාකාරී සැලැස්ම "ඇමුණුම 05" ලෙස මේ සමග අමුණා ඇත.

වෘත්තීය පුහුණුව සඳහා යොමු වන පුහුණුලාභීන් ආරම්භයේ සිට අවසානය දක්වා විධිමත්ව අදාල පාඨමාලා සඳහා යොමු වන්නේද සහ වෘත්තීය පුහුණු සාර්ථකත්වය සොයා බැලීම සඳහා මධ්‍යස්ථානාධිපතිගේ ප්‍රධාන වගකීමක් ලෙස පසු විපරම් කටයුතු සිදු කිරීමට පවරා ඇත.

මේ යටතේ අදාල උපදේශකවරුන් මාස දෙකකට වරක් පුහුණුලාභීන් විධිමත්ව වෘත්තීය පාඨමාලා සඳහා යොමු වන්නේද යන්න භෞතිකව වෘත්තීය පුහුණු ආයතන වෙත ගොස් නිරීක්ෂණය කරනු ලබයි. දිවයින පුරා පිහිටි සියලුම පුහුණු මධ්‍යස්ථාන වල මෙලෙස පසු විපරම් ක්‍රියාවලිය මූලස්ථානය භරහා සිදු කිරීම අපහසු කාර්යක් බැවින් යොවුන් සේනාංක පළාත් අධ්‍යක්ෂකවරුන්ගේ අධීක්ෂණය යටතේ පසු විපරම් කටයුතු සිදු කිරීම සඳහා බලය විමධ්‍යගත කර ඇත.

(iv) විගණන විමසුම මගින් දක්වා ඇති පරිදි, යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන තුල වෘත්තීය පුහුණු පාඨමාලා පවත්වන්නේ නම් ඒක් එක් වෘත්තීය පාඨමාලා සඳහා වෙන් වශයෙන් විශේෂඥ දැනුම සහිත උපදේශකවරුන්, පුහුණු පාඨමාලාවට අදාල භෞතික පුහුණු ද්‍රව්‍ය, ගොඩනැගිලි සහ අනෙකුත් යටිතලපහසුකම් තිබීම අත්‍යවශ්‍ය සාධකයකි. එපමණක් නොව, තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් ලබා දී ඇති නිර්ණායක අනුකූලවම ඉගැන්වීම් කටයුතු හා ප්‍රයෝගික පුහුණු ක්‍රියාකාරකම් සිදු කල යුතුය. එමෙන්ම, එම ආයතනය මගින් ලබා දෙන මාර්ගෝපදේශන පරිදි නියමිත ධාරිතාවයෙන් යුතු පන්ති කාමර සහ සුදුසුකම් සැපිරූ උපදේශකවරුන් නඩත්තු කල යුතුය. එමෙන්ම, විශේෂඥ දැනුම සහිත උපදේශකවරුන් සඳහා දැරිය යුතු වැටුප් වේතන වෙනුවෙන් සැලකිය යුතු පිරිවැයක් දැරීමට සිදු වන අතර ඔවුන් රඳවා තබා ගැනීමට ද විශේෂ පරිශ්‍රමයක් දැරීමට සිදු වනු ඇත.

තවද, ජීවන කුසලතා පාඨමාලාවක් අවසන් වීමෙන් පසු, එක් මධ්‍යස්ථානයක් තුළ වෘත්තීය පුහුණු පාඨමාලාවක් ආරම්භ කිරීම සඳහා එක් ක්ෂේත්‍රයකට අදාලව අවම‍ය පුහුණුලාභීන් 15 සංඛ්‍යාවක් වත් සිටිය යුතු අතර, එලෙස එක් ක්ෂේත්‍රයක් සඳහා යොමු වීමට කැමැත්ත දක්වන පුහුණුලාභීන් සංඛ්‍යාවක් රැස් වීම ඉතාමත් විරල අවස්ථාවකි.

එමෙන්ම, ප්‍රාදේශීය වශයෙන් දුෂ්කර මධ්‍යස්ථාන තුල වෘත්තීය පුහුණු පාඨමාලා පවත්වන්නේ නම් පුහුණුලාභීන් සඳහා ඇතැම්විට ආහාර පාන හා නවාතැන් පහසුකම්ද ලබා දීමට සිදු වීමෙන් සැලකිය යුතු තරමින් පිරිවැයක් දැරීමට සිදු වනු ඇත. එමෙන්ම, ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) ලබා දීමට නම් තුන් මාසික හෝ සය මාසික පුහුණු කාලයෙන් පසුව රැකියාගත කිරීම අනිවාර්ය වන බැවින් පුහුණුලාභීන් රැකියාගත කිරීමට සහ එහි ප්‍රගතිය සොයා බැලීමට අමතර කාර්යමණ්ඩලයක් යොවුන් සේනාංකය මගින් නඩත්තු කල යුතුය.

ජාතික යොවුන් සේනාංකයේ ප්‍රමුඛතම කාර්යභාරය වනුයේ, විනය, නායකත්වය, පෞරුෂ සංවර්ධනය යන ත්‍රිවිධ තේමාවන් පදනම් කර ගනිමින් රටෙහි තාරුණ්‍ය බලගැන්වීම උදෙසා 'ජීවන කුසලතා සංවර්ධන පාඨමාලා' ක්‍රියාත්මක කිරීමයි. ජීවන කුසලතා පාඨමාලාව සාර්ථකව අවසන් කරන ලද යුත්කැඩෙට්වරුන්ගේ අභිවෘද්ධිය උදෙසා ඔවුන් වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීම සිදු කරනු ලබන අතර විගණනය මගින් ලබා දී ඇති නිර්දේශ පරිදි සියලුම පුහුණු මධ්‍යස්ථාන තුල වෘත්තීය පුහුණු පාඨමාලා විධිමත් ලෙස ක්‍රියාත්මක කිරීම නිසැකව අසීරු කාර්යක් වනු ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

එනමුත්, ජාතික යොවුන් සේනාංකය විසින් විශේෂ ව්‍යාපෘතියක් ලෙස දඹුල්ල හෝටල් පුහුණු පාසැල 2014 වර්ෂයේදී ස්ථාපිත කර ඇති අතර මෙම පාසැල මගින් ජාතික වෘත්තීය සුදුසුකම් NVQ) III / IV) මට්ටමේ පාඨමාලා ක්‍රියාත්මක කරනු ලබයි. වසරකදී පුහුණුලාභීන් 500 ක ප්‍රමාණයකට පුහුණුව ලබා දීමේ හැකියාව මෙම හෝටල් පුහුණු ආයතනය සතුය. එමෙන්ම, හෝටල් පුහුණු පාසලකට අවශ්‍ය සියලු උපාංග වලින් සමන්විත මෙම පුහුණු පාසලේ හෝටල් ක්ෂේත්‍රයේ සුදුසුකම්ලත් දක්ෂ උපදේශක මණ්ඩලයක් මගින් පුහුණුව ලබා දෙනු ලබයි.

(v) 2024 සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාකාරී සැලැස්ම මගින් පුහුණුලාභීන් 80 දෙනකු යොමු කිරීමට ඉලක්ක කර ඇති අතර පැවති ප්‍රතිපාදන යටතේ පුහුණුලාභීන් 45 දෙනකු (4G වැල්ඩින් පාඨමාලාව 06, කිමිදුම් පැස්සුම් ශිල්පය සඳහා 39 දෙනකු) යොමු කිරීමට කටයුතු කරමින් 56.25% ක ප්‍රගතියක් ලබා ඇත.

එමෙන්ම, ප්‍රවර්තන වර්ෂය තුල රටේ ඉහළ පිළිගැනීමක් පවතින හෝටල් හා ආගන්තුක සත්කාර ක්ෂේත්‍රය සඳහා බහු කුසලතා (Multi skill) පුහුණු ශ්‍රමිකයන් යොමු කිරීම සඳහා විශේෂ පාඨමාලා

'Skill Development Programme in Hospitality Operations By SHMA' කිහිපයක් සෙංකඩගල, නාවුල, වීරවිල, නුවරඑලිය, බුලත්සිංහල, රාජගිරිය, අම්පාර, කුච්චවේලි, වාලච්චේන, කටුනායක යන පුහුණු මධ්‍යස්ථාන වල පවත්වමින් පුහුණුලාභීන් 643 දෙනකු පුහුණු කිරීමට කටයුතු කර ඇත.

විගණන නිර්දේශ මගින් ලබා දී ඇති උපදෙස් පරිදි සමාලෝචිත 2025 වර්ෂය වන විට රැකියා අභිමුඛ පාඨමාලා ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම සලකා බලමින් ඉලක්කගත පුහුණුලාභීන් සංඛ්‍යාව 500 දක්වා ඉහල නැංවීමට කටයුතු කර ඇත. එමෙන්ම 2025 වර්ෂයේ මේ වන විට රැකියා වෙළඳපල තුල ඉහල පිළිගැනීමක් පවතින බැරිස්ටා කොෆි සැකසීමේ පාඨමාලා සඳහා පුහුණුලාභීන් 30 දෙනකු යොමු කිරීමට කටයුතු කර ඇත.

(ඒ) කළමනාකරණ තොරතුරු පද්ධතියේ සියලුම මෘදුකාංග නිර්මාණ කිරීමේ කටයුතු Science Land Information Technology (PVT)Ltd (SLIT) ආයතනය මඟින් මේවන විට අවසන් කොට ඇත. ඒ අනුව Interface and database Design, Data Entering by sample data & unit testing අවසන් කොට මාර්තු මස තුල පද්ධතියේ මොඩියුල වල ක්‍රියාකාරිත්වය පිලිබඳව පුහුණු සැසි පවත්වා එක් එක් මොඩියුල වලට අදාලව Sample Data ඇතුලත් කොට පද්ධතියට හුරු කිරීමට අවශ්‍ය තාක්ෂණික සහය ද SLIT ආයතනය මඟින් ලබා දෙන ලදී.

ඒ අනුව MIS සඳහා සත්‍ය දත්ත ඇතුලත් කිරීම අප්‍රේල් මස සිට ආරම්භ කල අතර එහිදී සම්පූර්ණ පද්ධතියේ සියලුම කොටස් එකවර පරිශීලකයන් හට සත්‍ය දත්ත ඇතුලත් කිරීම සඳහා ලබා දුනහොත් පද්ධතිය පිලිබඳව User Resistance වැඩි වීම සාමාන්‍ය තත්වයක් බැවින් මෙම පද්ධතිය භාවිතයට හුරු වීම අදියර කිහිපයකින් ක්‍රියාත්මක කලයුතු බව සැසි වලදී අදාල ආයතනය මඟින් පැහැදිලි කරන ලදී. ඒ අනුව මොඩියුල වල අත්‍යවශ්‍යම කොටස් සඳහා පමණක් පළමුව සත්‍ය දත්ත ඇතුලත් කිරීමට අවකාශ ලබා දී ඒ සඳහා හුරුවීමක් ලබා ගන්නා අතරතුර අනෙකුත් උප කොටස් පරිශීලකයන්ට ක්‍රමානුකූලව හුරු කරවීමේ අවශ්‍යතාවයද පැහැදිලි කර දෙන ලදී.

ඒ අනුව මෘදුකාංග නිර්මාණයේ දී පරිශීලකයන් පද්ධතියට අනුගත කොට පද්ධතිය හරහා සියයට සියයක් රාජකාරි සිදු කිරීම නිශ්චිත කාල රාමුවකට ගැනීම ප්‍රයෝගික නොවන අතර තාක්ෂණික දැනුම අවම නිලධාරීන් වැඩි ප්‍රමාණයක් සිටින ආයතනයක් තුල මෘදුකාංග නිර්මාණය අවසන් වූ වහාම දැනට පවතින Manual System වලට සමගාමීව පද්ධතිය හරහා ද සියලුම දෛනික ක්‍රියාවලි සිදු කිරීම ද ප්‍රයෝගික නොවන කරුණකි.

පුහුණු මධ්‍යස්ථාන වල සත්‍ය තොරතුරු ඇතුලත් කිරීමේ දී පහත අපහසුතා වලට මුහුණ දෙමින් එම සියලුම ගැටළු නිරාකරණය කරමින් අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම සිදු කරමින් පවතී.

01. ආයතනයේ මානව සම්පත් හිඟ වීම තොරතුරු ලබා දෙන නිලධාරීන් මොඩියුල වලට අවශ්‍ය - ස්ථානය තුල රාජකාරි සිදු කරන නිලධාරීන් කළමනපුරප්පාඩුව පැවතීම හේතුවෙන් මධ්‍යාකරණය කරගනිමින් අදාල කටයුතු සිදු කරගැනීම .
02. තාක්ෂණික දැනුම අවම මට්ටමක පවතින නිලධාරීන් බහුල වීම නිසා එක් එක් නිලධාරියට වෙන් වෙන් වශයෙන් තාක්ෂණික සහය සැපයීමට සිදු වීම.
03. තොරතුරු ඇතුලත් කිරීමේ දී එක් එක් මධ්‍යස්ථානයට විවිධාකාර තාක්ෂණික ගැටළු මතුවීම හේතුවෙන් මධ්‍යස්ථානයෙන් මධ්‍යස්ථානයට වෙන් වෙන් වශයෙන් එම ගැටළු නිරාකරණය කලයුතු වීම.
04. පුහුණු මධ්‍යස්ථාන වල පිහිටීම අනුව සහ යම් යම් ප්‍රදේශ වල පවතින ප්‍රාදේශීය සංඥා අවම වීම ආදී හේතු මත අන්තර්ජාල පහසුකම් වල දුෂ්කරතා ඇතිවීම.

05. තම වසර ගණනාවක සාම්ප්‍රදායික ක්‍රමය වෙනස් කිරීමට අකමැති නිලධාරීන් ද ආයතනය තුල සිටීම සාමන්‍ය තත්වයක් වන අතර එබැවින් එම නිලධාරීන් පද්ධතියට අනුගත කිරීමට යම්කිසි කාලයක් ගතවීම.

ඉහත සඳහන් සියලුම අපහසුතා සහ ගැටළු වලට මුහුණ දෙමින් සාම්ප්‍රදායික ක්‍රමයට රාජකාරි කටයුතු සිදු කරන රාජ්‍ය ආයතනයක් ප්‍රථම වරට සියලුම රාජකාරි කටයුතු Fully Systematic ක්‍රමයකට සිදු කිරීමට ගන්නා ලද මෙම ප්‍රයත්නය තුලදී ඒ සඳහා යම්කිසි කාලයක් ගතවීමේ ප්‍රවණතාවයක් ඇත.

කරුණු එසේ වුවද අප ආයතනයේ නිලධාරීන් තොරතුරු කළමනාකරණ පද්ධතියට අනුගත වෙමින් තම මොඩියුල වලට අදාල සත්‍ය තොරතුරු ඇතුලත් කරමින් මූලික කොටස් හරහා දෛනික රාජකාරි කටයුතු පද්ධතියෙන් සිදු කර ගැනීම මේවන විට සිදු කරමින් පවතී.

(ඔ) 2007 – 2018 කාල සීමාවන්හිදී පුහුණු මධ්‍යස්ථානයන් කිහිපයක භාණ්ඩ සොරකම් කිරීම් සහ නිවැරදිව භාණ්ඩ ආපසු භාර නොදීම හේතුවෙන් පවතින භාණ්ඩ ඌනතා සඳහා එම එක් එක් අවස්ථාවන්හි පොලිස් පැමිණිලි සිදු කිරීම, අදාල නිළධාරීන්ට භාණ්ඩ ආපසු භාර දීම සඳහා වන ලිඛිත දැනුවත් කිරීම් සිදු කරන ලදී. එමඟින් එම ඌණතා මුදල් අය කර ගැනීම සඳහා වූ ක්‍රියාමාර්ග ගනු ලැබුවද පැවැත් වූ පොලිස් විමර්ශනයන්හි ප්‍රගතියක් නොමැති වීම සහ භාණ්ඩ ආපසු භාර දීම් සිදු කරන ලෙස යොමු කරන ලද ලිඛිත ලියවිලි සඳහා දිගින් දිගටම ප්‍රතිචාර නොදැක්වීම හේතුවෙන් විමර්ශන කටයුතු අවසන් කිරීමට නොහැකි වී පැවතුනි. මේ හේතුවෙන් දිගින් දිගටම පවතින භාණ්ඩ ඌනතා පොත්වලින් කපාහැර අවසන් කිරීමට අවශ්‍ය නිර්දේශය ලබා ගැනීම සඳහා ආයතනික විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වෙත තෙවරක් ඉදිරිපත් කල නමුත් පැහැදිලි නිර්දේශයක් එමඟින් නොලැබුණි. අවසන් වරට, එනම් 2025.05.21 දින ජාතික යොවුන් සේනාංක මූලස්ථානයේ පැවති අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වෙත නැවත වරක් උක්ත කරුණ ඉදිරිපත් කිරීමේදී, ජාතික යොවුන් සේනාංක අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර අවශ්‍ය නිර්දේශය ලබා ගැනීමෙන් පසු පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කරන ලෙස එදින කමිටුවේදී ලබා දෙන ලදී. ඒ අනුව අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීම සඳහා වූ වාර්තාව මේ වන විට සකස් කර අවසන්ව ඇත.

(ඕ) තොග මිලදී ගැනීම් හා නිකුත් කිරීම්

(i) 2025 වර්ෂය සඳහා බඳවා ගැනීමට සැලසුම් කර පැවති 12,000 ක යුත් කැඩෙට්වරු සඳහා එක් අයකුට ටී ෂර්ට් -2 , කලිසම් -2 සහ කැන්වස් යුගල 01 සහ බැඳ පටි 1 බැගින් වන පරිදි ලබා දීමට අවශ්‍ය පුහුණු නිළ ඇදුම් සම්පූර්ණ කර ගත යුතු බවට ලබා දුන් උපදෙස් අනුව එවකට අඩුපාඩුව පැවති ටී ෂර්ට් 14,000 ,කලිසම් 9,800, කැන්වස් සපත්තු 6,400 ක ප්‍රමාණය සඟ බඳ පටි 7,500 ක ප්‍රමාණය මිලදී ගැනීම සඳහා වූ ඉල්ලුම්පත ගබඩා අංශය විසින් 2024.10.09 දින යොමු කරන ලදී.

තවද 2025 – 1 කණ්ඩායම සඳහා වූ පුහුණු නිල ඇදුම් 2025 ජනවාරි මස වන විට බෙදාහැරීම් සිදු කිරීම සඳහා අවශ්‍ය වූ බැවින් ඉහත සඳහන් මුළු තොගය ඇණවුම් කිරීම සඳහා වූ ක්‍රියාවලිය සඳහා

සැලකිය යුතු කාල සීමාවක් ගත වන බැවින් ඒ වන විට පැවති පුහුණු නිල ඇදුම් තොගය 2025 – 1 කණ්ඩායම සඳහා ප්‍රමාණවත් නොවූ ප්‍රමාණයන්ගෙන් (SIZE) අවශ්‍ය ටී ෂර්ට් 2,000 ක ප්‍රමාණය සහ කැන්වස් සපත්තු 400 ක ප්‍රමාණය පමණක් 2024 ඉතිරිව පැවති අය වැය ප්‍රතිපාදන යටතේ මිලදී ගැනීම් සිදු කිරීම සඳහා වූ ඉල්ලුම් කිරීම් 2024.12.10 දින යොමු කරන ලදුව 2025.03.28 දින වන විට ඊට අදාල මුළු තොගය සැපයුම් කර පැවතුනි.

2021 වර්ෂයේ බඳවා ගැනීමට සැලසුම් කර පැවති 18,000 ක යුත් කැඩෙට් වරුන් සඳහා අවශ්‍ය තොග රැස් කිරීමට ලද උපදෙස් අනුව ටී ෂර්ට් 36,000 ක ප්‍රමාණයක් සපයා ගැනීම සඳහා වූ ඉල්ලීම 2020.09.17 දින සිදු කරන ලදී. ටී ෂර්ට් 36,000 ක ප්‍රමාණයට අදාලව XS ප්‍රමාණයෙන් (Size) 4,000 ක ප්‍රමාණයකුත් S ප්‍රමාණයෙන් (Size)10,500 ක ප්‍රමාණයකුත් ලෙස අවශ්‍ය මිලදී ගැනීම් සිදු කරන ලදී. නමුත් පැවති covid 19 වසංගත තත්ත්වය හමුවේ අපේක්ෂිත යුත් කැඩෙට් වරුන් ප්‍රමාණය බඳවා ගැනීමේ ප්‍රයෝගික ගැටළු හමුවේ 2021 වර්ෂය සඳහා මිලදී ගනු ලැබූ පුහුණු නිළ ඇදුම් අපේක්ෂිත අයුරින් භාවිතයට ගැනීමට නොහැකි විය. නමුත් ඊට පසු වර්ෂයන්හිදී එනම් 2025 වර්ෂය වන තෙක්ම XS ප්‍රමාණයෙන් (Size), සහ S ප්‍රමාණයෙන් (Size) ටී ෂර්ට් මිලදී ගැනීම් සිදු නොකර පවතින අතර 2021 වර්ෂයෙන් පසු යුත් කැඩෙට්වරුන් කණ්ඩායම් සඳහා බෙදාහැරීම් සිදු කර XS ප්‍රමාණයෙන් (size) 1,807 ක ප්‍රමාණයකුත් S ප්‍රමාණයෙන් (Size) 3215 ක ප්‍රමාණයක් පමණක් මෙ වන විට ඉතුරුව පවතී. මෙම ප්‍රමාණයන් ද ඉදිරියේදී බඳවා ගැනීමට අපේක්ෂිත යුත් කැඩෙට් වරුන්ගේ ඉල්ලීම් සඳහා බෙදාහැරීමට කටයුතු කරනු ලැබේ.

(ii) යුත් කැඩෙට්වරුන් සඳහා ලබා දෙන බඳ පටි 2024.12.31 දිනට පෙන්වා දීම් සිදු කිරීමේදී 2024 පළමු කණ්ඩායම සඳහා බෙදාහැරීම් සිදු කිරීමෙන් පසු ඉතිරි වූ ප්‍රමාණය පමණක් වැරදීමකින් සැලකිල්ලට ගෙන ඇති අතර එය 6,117 ක ප්‍රමාණයක් ලෙස නිවැරදි විය යුතු බව කාරුණිකව පෙන්වා දෙමි. එයට අදාල ගැලපුම් සිදු කිරීම 2025 වාර්ෂික ගිණුම් ප්‍රකාශන තුල සිදු කිරීමට කටයුතු කරන බවත් පෙන්වා දෙන අතර 2025 – 1 කණ්ඩායම සඳහා බෙදාහැරීම් සිදු කරන ලද ප්‍රමාණය 2,851 ක් වේ. ඒ අනුව 2025.05.30 දිනට පවතින ඉතිරි බඳ පටි ප්‍රමාණය 3,266 ක ප්‍රමාණයක් බව පෙන්වා දෙමි.

විස්තරය	පුහුණු මධ්‍යස්ථානයන්	ප්‍රධාන ගබඩාව	එකතුව
2024.12.31 දිනට ශේෂය	1,596	4,521	6,117
2025.01.01 දින සිට 2025.05.30 දින දක්වා පුහුණු මධ්‍යස්ථානයන් වෙත බෙදාහැරීම්	3,121	(3,121)	
2025.05.30 දිනට තොගය	1,866	1,400	3,266
2025 -1 කණ්ඩායම සඳහා බෙදාහැරීම්	2,851		2,851

2025 – 1 කණ්ඩායම සඳහා ලියාපදිංචි පුහුණු ලාභීන් සහ හෝටල් පාඨමාලාව සඳහා ලියාපදිංචි යුත් කැඩෙට් වරුන් සඳහා බෙදාහැරීම් සිදු කරන ලද ප්‍රමාණය 2,851 ක් වේ.

(iii) 2015 වර්ෂය ආරම්භයේදී රු. 33,979,175 ක් වටිනාකම් වූ නිල් පැහැති විසිර යාමේ නිල ඇදුම් තොගයේ පැවති අතර මෙම විසිර යාමේ නිළ ඇදුම් පාඨමාලාව අවසානයේ පවත්වනු ලබන විසිර යාමේ උත්සවයන් සඳහා (වසරකට පවත්වනු ලබන පාඨමාලාවන් ප්‍රමාණය අනුව) නිකුත් කර කාර්යය අවසන් වූ පසුව නැවත පුහුණු මධ්‍යස්ථානය වෙත ලබා ගැනීමක් සිදු කරනු ලැබේ. 2016 වර්ෂයේදී යොවුන් සේනාංක සභාව විසින් ගනු ලැබූ තීරණයකට අනුව විසිර යාමේ නිළ ඇදුම්හි සිදු කරන ලද වෙනස්කම් අනුව රු 40,276,010 ක මුදලක් වැය කරමින් නව නිළ ඇදුම් මිලදී ගැනීමක් 2016 වර්ෂයේ අග භාගයේ සහ 2017 වර්ෂයේ මූල සිදු කර ඇත. ඒ අනුව මෙම නිළ ඇදුම් භාවිතයකින් තොරව ගබඩාවේ තබා ගැනීමක් නොවන අතර නැවත නැවත පුහුණු ලාභීන් වෙත නිකුත් කර අදාල කාර්යයයෙන් පසුව නැවත ලබා ගැනීම් සිදු කරනු ලබයි. වර්ෂය අවසානයේදී වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනා ගනු ලබන භාවිතයට නුසුදුසු නිළ ඇදුම් පමණක් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් පසු අපහරණය සිදු කරනු ලබන අතර පවතින මුළු තොග ප්‍රමාණය වාර්ෂික ගිණුම් ප්‍රකාශන තුල ඉදිරිපත් කරනු ලැබේ.

(iv) 2024 වර්ෂය සඳහා බඳවා ගැනීමට සැලසුම් කරන ලද යුත් කැඩෙට් වරුන් 12,000 ක ප්‍රමාණය සඳහා අවශ්‍ය මිලදී ගැනුම් 2024 වර්ෂය තුල සිදු කර පවතින අතර 2024 වර්ෂය තුල පුහුණු නිළ ඇදුම් කලිසම් 13,265 ක ප්‍රමාණයක්,ටී ෂර්ට් 13,540 ක ප්‍රමාණයක් සහ කැන්වස් සපත්තු 7,107 ක ප්‍රමාණයක් පුහුණු ලාභීන් කණ්ඩායම් 03 ක් සඳහා නිකුත් කර ඇත. 2024 වර්ෂය අවසානයේ පැවති පුහුණු නිළ ඇදුම් තොගය 2025 – 1 කණ්ඩායම සඳහා මේ වන විට නිකුත් කර පවතින අතර, 2025.05.30 දින වන විට පුහුණු නිළ ඇදුම් කලිසම් 13,131 ක ප්‍රමාණයක්, ටී ෂර්ට් 12,804 ක ප්‍රමාණයක්, කැන්වස් සපත්තු 4,636 ක ප්‍රමාණයක් සහ බැඳ පටි 3,266 ක ප්‍රමාණයක් පුහුණු මධ්‍යස්ථාන 58 ක සහ ප්‍රධාන ගබඩාව සතුව පවතින අතර එම තොගය 2025- 11 කණ්ඩායම සහ ඉදිරියේදී බඳවා ගැනීමට නියමිත කණ්ඩායම් සඳහා බෙදාහැරීමට සැලසුම් කර පවතී. මෙලෙස සමස්ත තොගය පෙන්නුම් කරනු ලැබුවද පුහුණු ලාභීන්ගේ නිල ඇදුම් ප්‍රමාණයන් (SIZE) අනුව බෙදාහැරීම් සිදු කිරීමේදී අවම තොග මට්ටමක් පවත්වා ගැනීම තුල කළමනාකරණය කිරීම ප්‍රායෝගිකව අපහසු කටයුත්තක් බවත් පෙන්වා දෙමි.

(ක) ගෙවිය යුතු ශේෂය වර්ෂ 2ත් 04 ත් අතර කාලයට අදාලව රු.6,277,103.00 ක හා වර්ෂ 5 ට වැඩි ගෙවිය යුතු දෑ හී වටිනාකම රු.1,316,805.00 ක මුදල නිරවුල් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

1	දඹුල්ල (දිගම්පතන)	K S CONSTRUCTION AND ENGINEERING (PVT) LTD	600,000.00	K S CONSTRUCTION AND ENGINEERING (PVT) LTD යන කොන්ත්‍රාත් ආයතනය පැල්මඩුල්ල මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වෙනුවෙන් ලබා ගත් රු.15,018,460.81 ක් වන අත්තිකාරම් මුදල ජාතික යොවුන් සේනාකය වෙත නොගෙවීම හේතුවෙන් කොන්ත්‍රාත් කරු දැනුවත් කර ඇති අතර , දඹුල්ල (දිගම්පතන) මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වෙනුවෙන් රඳවා ගත් රැඳවුම් මුදලින් පැල්මඩුල්ල මධ්‍යස්ථානයේ අත්තිකාරම් මුදල අය කර ගැනීමට කටයුතු කිරීමට නියමිතව ඇති බව දන්වා සිටිමි.
2	දඹුල්ල (දිගම්පතන)	K S CONSTRUCTION AND ENGINEERING (PVT) LTD	69,185.13	
3	දඹුල්ල (දිගම්පතන)	K S CONSTRUCTION AND ENGINEERING (PVT) LTD	505,119.74	
4	දඹුල්ල (දිගම්පතන)	K S CONSTRUCTION AND ENGINEERING (PVT) LTD	142,499.87	
5	දඹුල්ල (දිගම්පතන)	K S CONSTRUCTION AND ENGINEERING (PVT) LTD	536,918.37	
6	දිගම්පතන	K S CONSTRUCTION AND ENGINEERING (PVT) LTD	1,146,276.76	
7	දිගම්පතන	K S CONSTRUCTION AND ENGINEERING (PVT) LTD	900,000.00	
8	හලාවත	SEVANA builders	480,000.00	2024 වර්ෂයේ අන්‍යෝන්‍ය අවබෝධතා ඔත ගිවිසුම අවලංගු කර අවසන් බිල්පත ලැබීමෙන් පසු රැඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු නියමිතව ඇති බව කාරුණිකව දන්වා සිටිමි.
9	නාවුල	SEVANA builders	363,943.20	
10	නාවුල	SEVANA build	403,584.00	
11	නාවුල	SEVANA builders	409,390.11	
12	නාවුල	SEVANA builders	170,000.00	
13		NEMO RETENTION	1,866,990.93	NEMO ආයතනය ඉදිකිරීම් වෙනුවෙන් ලබා ගත් අත්තිකාරම් මුදල වන රු.37,615,679.51 ක මුදල මෙම රැඳවුම් මුදලින් අඩු කර ගැනීම සඳහා සභා පත්‍රිකාව සකස් කර ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා සභා අනුමැතිය ලැබී ඇති බැවින් මෙම රැඳවුම් මුදලින් ඉහත අත්තිකාරම් මුදල අඩු කරගැනීමට කටයුතු කිරීමට නියමිත බව දන්වා සිටිමි.

(ග) එක් එක් පුහුණු මධ්‍යස්ථානයන් ට අදාලව සහ ප්‍රධාන ගබඩාව , මූලස්ථාන ගබඩාවන්ට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවන් 62 ක ප්‍රමානය පෙර වර්ෂයන්හිදී මෙන්ම 2024 වර්ෂයට අදාලවද 2025.03.06 වන දින රජයේ විගණන අංශය වෙත භාර දීම් සිදු කර ඇති අතර විගණන අංශය වෙත ඉදිරිපත් කරනු ලබන එම වාර්තා අවසන් වාර්තාවන් වේ.